# 9 ශ්‍රේණිය



# විද්‍යාව

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ක්ෂුද්‍ර ජීවින්ගේ භාවිත

**01.** ක්ෂුද්‍ර ජීවින්ගේ ක්‍රියාකාරිත්වය හඳුනාගනිමු.

I. පොල් ගෙඩියක ඇති පොල් වතුර පිරිසිදු කෝප්පයකට දමන්න.

II. පොල් වතුර ස්වල්පයක සුවඳ හා වර්ණය බලන්න.

III. ඉතිරිය දැල් වට්ටියකින් වසා මේසයක් මත තබන්න. (මීයන්, කැරපොත්තන් හා මැස්සන් වැනි සතුන්ගෙන් ආරක්ෂා වන සේ තබාගත යුතු ය.)

IV. පහත වගුවේ පරිදි නිරීක්ෂණ සටහන් කරන්න.

| නිරීක්ෂණය ලබාගත් කාලය(පැය) | නිරීක්ෂණ |
|---|---|
| පැය 0 | |
| පැය 24 | |
| පැය 49 | |
| පැය 72 | |
| පැය 96 | |

V. ඉහත නිරීක්ෂණ හැකි පමණ පැහැදිලි කරන්න.



අන්තර්ගතය : විද්‍යා ශාඛාව, අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
සැකසුම : එස්.ඩබ්.ඊ.එස්.ඒ.එම්.ඒ.සී.එස්. මැණිකේ , කු/පැරකුම්පුර ජාතික පාසල, සෝල්ලේපුර
Copyright © www.e-thaksalawa.moe.gov.lk

**02.** නොපෙනෙන මිතුරෝ, ක්ෂුද්‍ර ජීවී මිතුරෝ, අපේ මිතුරු ක්ෂුද්‍ර ජීවීන් වැනි මාතෘකාවක් තෝරාගෙන මිනිත්තු **5**ක කථාවක් , විරිඳු පන්තියක් , චිත්‍ර කතාවක්, නාට්‍යක් හෝ වීඩියෝ පටයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

**03.** ක්ෂුද්‍ර ජීවීන් යොදාගෙන කරන කර්මාන්ත නමින් කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න.

පහත ප්‍රශ්නවලට සුදුසු පිළිතුර සපයන්න

**01.** පාන් පෙත්තක් මතට ජලය ස්වල්පයක් දමා දින කිහිපයක් තබන්න. (දින **3 -4** ක්)

**a)** එම පාන් පෙත්ත මත දැකිය හැකි නිරීක්ෂණ මොනවාද?

**b)** ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය නිසා ආහාරවල සිදුවන වෙනස්කම් මොනවාදැයි, පුස් බැඳුණු පාන් පෙත්තක නිරීක්ෂණ ඇසුරින් ඉදිරිපත් කරන්න.

**02.** ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය ආහාර වර්ගය අනුව වෙනස් වේ.ඒ හා සම්බන්ධ පහත පද උදාහරණ ඇසුරෙන් පහදන්න.

**a)** පැසීම

**b)** පූතිභවනය

**c)** මුඩුවීම

03. ක්ෂුද්‍ර ජීවීන් නිසා ශාකවලට වැළදෙන රෝග 3ක් නම් කර එම එක් එක් ඒවාට උදාහරණ බැගින් දෙන්න.



අන්තර්ගතය : විද්‍යා ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
සැකසුම : එස්.ඩබ්.ඊ.එස්.ඒ.එම්.ඒ.සී.එස්. මැණිකේ , කු/පැරකුම්පුර ජාතික පාසල, සෝලේපුර

Copyright © www.e-thaksalawa.moe.gov.lk